**2016 නොවැම්බර් මස ඉස්ලාමාබාද් හි දී පැවැත්වීමට නියමිත 19 වැනි සාර්ක් සමුළුව සඳහා ශ්‍රී ලංකාවේ සහභාගිත්වය**

19 වැනි සාර්ක් සමුළුව 2016 නොවැම්බර් මස 09 සහ 10 යන දිනවල ඉස්ලාමාබාද් හි දී පැවැත්වීමට කළාපය තුළ දැනට පවතින වාතාවරණය සුදුසු නොවන බව කණගාටුවෙන් වුවද ප්‍රකාශ කිරීමට ශ්‍රී ලංකාවට සිදුවේ.

කලාපීය සහයෝගීතාවය සඳහා දකුණු ආසියානු සංගම් (සාර්ක්) ප්‍රඥප්තියෙහි පොදු විධිවිධානවලට අනුකූලව සියලුම මට්ටම්වලදී ගනු ලබන තීරණ ඒකමතිකභාවයකින් යුක්ත විය යුතු අතර එම ප්‍රතිපත්තිය සාර්ක් සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ රැස්වීම් කැඳවීම පිළිබඳ කාරණය සඳහාද අදාළ වේ.

සාමය හා ආරක්ෂාව යනු දකුණු ආසියානු ජනතාවගේ යහපත උදෙසා වූ අර්ථාන්විත කලාපීය සහයෝගීතාවයේ සාර්ථකත්වය සඳහා අත්‍යාවශ්‍ය වන අංගයන්ය. කලාපීය සහයෝගීතාවය සඳහා කැපවූ සාර්ක් සංවිධානයේ ආරම්භක සාමාජික රටක් වශයෙන්, කලාපීය සහයෝගීතාව උදාකර ගැනීම සඳහා සුදුසු වාතාවරණයක් ඇතිකිරීම වෙනුවෙන් අප කලාපයේ සාමය හා ආරක්ෂාව තහවුරු කෙරෙන පියවර ගනු ඇතැයි ශ්‍රී ලංකාව බලාපොරොත්තු වෙයි.

ශ්‍රී ලංකාව සියලුම ආකාරයේ ත්‍රස්තවාදී කටයුතු හා එවැනි ප්‍රකාශ කිරීම් හෙළා දකින අතර කලාපය තුළ ත්‍රස්තවාදය තීරණාත්මක අන්දමින් තුරන් කිරීමේ අවශ්‍යතාව දැඩිව අවධාරණය කරයි.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ
2016 සැප්තැම්බර් මස 30 වැනිදා